සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

60 S II

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : .............................. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය- II කාලය : පැ. 02යි.**

වැදගත් :

⁕ පළමු ප්‍රශ්නය ඇතුළුව , I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, බැගින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) **පහත සඳහන් සිද්ධිය ඇසුරින් i අංක x දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දෙනෙත් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසු තම යහළුවෙකු වූ ජනිතගේ පියා විසින් පවත්වාගෙන යනු ලබන ස්වාභාවික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත කර්මාන්තශාලාවේ සේවයට බැඳුණේය. ටික කාලයක් එහි සේවය කළ දෙනෙත් එහිදී ලද පුහුණුව හා අත්දැකීම් උපයෝගී කරගෙන තමා ඉතිරි කරගත් රු. 50 000ක මුදල යොදා 2019 ජූනි මස 01 දින ''විසිතුරු විස්කම්'' නමින් ව්‍යාපාරයක් ආරම්භ කළේය.

දෙනෙත් තම පියාගේ යතුරුපැදිය උපයෝගී කරගෙන තම ගම් ප්‍රදේශයේ ඇති පොල් කටු මිලදී ගෙන විසිතුරු ආභරණ සහ විසිතුරු සැරසිලි නිර්මාණය කර නගරයට ගොස් බස්නැවතුම්පොළ ඉදිරිපිට අලෙවි කරන්නේය. ඔහුගේ ව්‍යාපාරයේ ජූනි මස තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2019-06-05 පොල්කටු මිලදී ගත්තා | රු. | 10 000 |
| 2019-06-05 යතුරු පැදිය සඳහා පෙට්‍රල් වියදම | රු. | 1 000 |
| 2019-06-06 පොලිෂ් සහ අනෙකුත් ද්‍රව්‍ය | රු. | 3 000 |
| 2019-06-10 අවශ්‍ය කුඩා උපකරණ සඳහා | රු. | 5 000 |
| 2019-06-20 පොල්කටු මිල දී ගත්තා | රු. | 10 000 |
| 2019-06-25 සේවක වැටුප් | රු. | 5 000 |
| 2019-06-30 විකුණුම් | රු. | 25 000 |
| 2019-06-30 දිනට ගෙවිය යුතු විදුලිය | රු. | 1 500 |

(i) ඉහත සඳහන් සිද්ධියට අදාල ''පොල්කටු'' කුමන නිෂ්පාදන සාධකයට අයත්වේ ද?

(ii) මෙම ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(iii) එම ව්‍යාපාර සංවිධානයේ වාසියක් හා අවාසියක් ලියන්න.

(iv) ''විසිතුරු විස්කම්'' ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? එසේ නම් ඊට හේතුව ලියන්න.

(v) ඉහත සඳහන් ව්‍යාපාරය පහත ශීර්ෂ අනුව වර්ග කරන්න.

| අයිතිය අනුව | අරමුණ අනුව |
|---|---|
| | |

(vi) ඉහත සඳහන් ව්‍යාපාරය සතු ශක්තියක් හා අවස්ථාවක් ලියා දක්වන්න.

(vii) ''විසිතුරු නිමැවුම්'' ව්‍යාපාරයට අයත් මූලික පොත නම් කර ඊට අදාල මූලාශ්‍ර ලේඛන ලියා දක්වන්න.

(viii) 2019-06-01 දිනට ගිණුම්කරණ සමීකරණ ලියන්න.

(ix) 2019-06-30 දිනට මුදල් ශේෂය මුදල් පොතක් පිළියෙල කර පෙන්වන්න.

(x) ඉහත සඳහන් ව්‍යාපාරයේ හිමිකම අඩුවීමට සහ හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුවක් බැගින් ලියන්න.

(2 x 10 = 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(02) (i) (අ) භාණ්ඩ හා සේවා අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 01)

(ආ) පාසලක ඇල්මැති පාර්ශව දෙකක් ලියා දක්වන්න. (ලකුණු 01)

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ලකුණු 02)

(අ) ව්‍යාපාරයේ සේවකයින්ගේ විශේෂඥ දැනුම එම ව්‍යාපාරයේ අවස්ථාවකි.

(ආ) සිල්ලර වෙළඳ ව්‍යාපාර සේවා ව්‍යාපාර වේ

(ඉ) අවශ්‍යතා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකිවන අතර වුවමනා නිර්මාණය කළ නොහැක.

(ඊ) මිනිස් අවශ්‍යතා විවිධ වන අතර වුවමනා සීමිත වේ.

(iii) කමනි වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හරහා මෙහෙයවන ලද මැහුම් පාඨමාලාවක් හදාරා ඇත. ප්‍රධාන මාර්ගය අසල පාසලට හා අධ්‍යාපන කාර්යාලයට නුදුරින් ඇති කඩ කාමරයක් තුළ මැහුම් ව්‍යාපාරයක් ඇරඹීමට ඈ අදහස් කරගෙන සිටියි. මෙම මැහුම් ව්‍යාපාරයට ඇති.

(අ) ශක්තියක් ලියා දක්වන්න. (ලකුණු 01)

(ආ) අවස්ථාවක් ලියා දක්වන්න. (ලකුණු 01)

(iv) කවීෂා වියළා සකස් කළ පන් ආශ්‍රයෙන් හිස් වැසුම්, මුදල් පසුම්බි ආදී පන් ආශ්‍රිත නිෂ්පාදන සකසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) කවීෂාගේ ව්‍යාපාරයෙන් සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද? (ලකුණු 01)

(ආ) මෙහිදී යොදා ගැනෙන වියළා සකස් කළ පන් අයත්වන නිෂ්පාදන සාධක කුමක් ද? (ලකුණු 01)

(2 x 4 = 8)

(03) (i) පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

ව්‍යාපාරයක් සාර්ථක වීමට නම් ව්‍යාපාර පරිසරය පිළිබඳ නිරන්තර අවධානය යොමු කිරීම වැදගත් බව ව්‍යාපාරයේ අයිතිකරු තම සේවකයන් හා කළමණාකරුවන් අමතා ප්‍රකාශ කරන ලදී. එයට අමතරව ව්‍යාපාරය සමග කටයුතු කරන ගණුදෙනුකරුවන්, සැපයුම්කරුවන් හා තරගකරුවන් පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කළ යුතු බව ද ඔහු පවසන ලදී.

(අ) ඉහත ඡේදයේ දැක්වෙන පරිදි ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වන පර්ශවයක් නම් කර එම පාර්ශවයෙන් ව්‍යාපාරයට වන බලපෑමක් සඳහන් කරන්න. (ලකුණු 01)

(ආ) මෙම ඡේදයට අනුව ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත්වන පාර්ශව දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) පහත දැක්වෙන වාක්‍යවල අදහසට ඔබට එකඟ විය හැකි නම් සත්‍ය ලෙස ද, එම වාක්‍යවල අර්ථයට ඔබට එකඟ විය නොහැකි නම් අසත්‍ය ලෙස ද සඳහන් කරන්න.

(අ) අයවැය ප්‍රතිපත්තිය නෛතික පරිසරයට අයත් නිදසුනක් ලෙස දැක්විය හැක.

(ආ) දේශපාලන පරිසරයට අයත් කාර්යභාර්යක් ලෙස සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය දැක්විය හැක.

(ඉ) යටිතල පහසුකම සංවර්ධන ප්‍රතිපත්ති දේශපාලන පරිසරයට අයත් වේ.

(ඊ) මධ්‍යම පරිසර අධිකාරියේ අණපනත් හා නීතිරීති දේශපාලන පරිසරයට අයත් වේ.

(ලකුණු 1/2 x 4 = 2)

(iii) පහත දැක්වෙන්නේ පුවත්පත් වාර්තාවකින් උපුටාගත් කොටසක් වේ. ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.

පසුගිය දිනක ශ්‍රී ලංකාව ගෝලීය ත්‍රස්ත ප්‍රහාරයකට ලක් වූ අතර මේ සඳහා දේශපාලන අධිකාරිය වගකිව යුතු බව මහජනතාව චෝදනා කරන ලදී. මෙම නිසා සංචාරක කර්මාන්තයට යම් බලපෑමක් ඇති බවත් පවතින නීති රාමුව හා නවීන තොරතුරු සන්නිවේදන ක්‍රම ත්‍රස්තවාදය මැඩලීමට ප්‍රමාණවත් නොවන බව රජය විසින් ප්‍රකාශ කරන ලදී.

(අ) සංචාරක ව්‍යාපාරයට සිදු වූ ආර්ථික බලපෑම බාහිර පරිසරයේ කුමන පරිසර සාධක අයත් වේද?

(ලකුණු 01)

(ආ) මෙම සිදුවීමට අදාලව නෛතික පරිසරයේ ක්‍රියාකාරිත්වය ප්‍රමාණවත් නොවන බව සඳහන් වේ. එහි ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීමට සුදුසු යෝජනාවක් ඉදිරිපත් කරන්න. (ලකුණු 01)

(iv) ව්‍යාපාරයක් අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් ශක්තිය හා දුර්වලතා හඳුනාගත හැකි අතර ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් ව්‍යාපාරයට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය.

(අ) ව්‍යාපාරයක ශක්තීන් සඳහා නිදසුන් දෙකක් ලබා දෙන්න. (ලකුණු 01)

(ආ) ව්‍යාපාරයකට ඇති තර්ජන සඳහ නිදසුන් දෙකක් ලියන්න. (ලකුණු 01)

(2 x 4 = 8)

(04) (i) (අ) හවුල් ව්‍යාපාරයක් යනු කුමක්ද? (ලකුණු 01)

(ආ) හවුල් ව්‍යාපාරවලට බලපාන පනත් දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) පහත සඳහන් ප්‍රකාශ 'සත්‍යය ද' 'අසත්‍යය ද' යන්න ලියා දක්වන්න.

(අ) හවුල් ව්‍යාපාරවලට අඛණ්ඩ පැවැත්මක් ඇත.

(ආ) සංස්ථාපිත සමාගම්වල වගකීම සීමා සහිත වේ.

(ඉ) සංස්ථාපිත සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමණාකරය කෙරේ.

(ඊ) රාජ්‍ය දෙපාර්තමේන්තුවලට තීරණ ගැනීමේ ස්වාධීනත්වයක් ඇත. (1/2 x 4 = 2)

(iii) සමුපකාර සමිති ස්වේච්ඡාවෙන් එකට එකතු වී, සාමූහික අයිතියක් භුක්ති විඳින, පුද්ගල කණ්ඩායමක පොදු අවශ්‍යතා ඉටුකර ගැනීම අරමුණු කර ගත් ව්‍යාපාර සංවිධානයකි.

(අ) සමුපකාර සමිතිවල දැකිය හැකි ලක්ෂණ 2ක් ලියන්න. (1/2 x 2 = 1)

(ආ) සමුපකාර සමිතිවල අවාසියක් ලියන්න. (ලකුණු 01)

(iv) පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතන කිහිපයකි. මෙම ආයතන ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය ලියා දක්වන්න.

(අ) දුම්රිය දෙපාර්තමේන්තුව (ආ) සුපුන් ස්ටෝර්ස්

(ඉ) විවිධ සේවා සමුපකාර සමිති (ඊ) සී/ස රිවඩ් පීරිස් සමාගම (2 x 4 = 8)

## II කොටස - ගිණුම්කරණය

(05) (i) (අ) වගකීමක දැකිය හැකි ලක්ෂණ දෙකක් නම් කරන්න. (1/2 x 4 = 2)

(ආ) හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනුවක් ලියා දක්වන්න. (1 x 2 = 2)

(ii) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකින් ගිණුම්කරන සමීකරණයට සිදු වූ බලපෑම පහත දක්වා ඇත. ඒ අනුව සිදු වූ ගනුදෙනුව ලියා දක්වන්න.

| දිනය | වත්කම් | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|
| (අ) 2019-01-01 | අඩු වීම<br>වැඩි වීම | | | |
| (ආ) 2019-01-02 | අඩු වීම | = | අඩු වීම | |
| (ඉ) 2019-01-03 | වැඩි වීම | = | | වැඩි වීම |
| (ඊ) 2019-01-04 | අඩු වීම | = | | අඩු වීම |

(1 x 4 = 4)

(iii) පහත ගනුදෙනුවලට අදාල ද්විත්ව සටහන් ලියා දක්වන්න.

(අ) රු. 300 000ක් වටිනා ඉඩමක් මිලට ගැනීම.

(ආ) කවීෂ නැමැති ණයගැතියා විසින් රු. 50 000ක් මුදලින් ගෙවා ණය පියවීම. (1 x 2 = 2)

(iv) දිව්‍යාගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

| **වත්කම්** | | **වගකීම** | |
|---|---|---|---|
| ලී බඩු උපකරණ | 75 000 | බැංකු ණය | 50 000 |
| ගොඩනැගිලි | 150 000 | ණය හිමියෝ | 30 000 |
| මුදල් | 25 000 | | |

එම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

(v) හිමිකම වෙනස්වීමට බලපාන ප්‍රධාන කරුණු 4 ලියා දක්වන්න. (ලකුණු 02) (ල.12)

(06) (i) මුදල් පොතේ ද්විත්ව කාර්යය නම් කරන්න. (ලකුණු 02)

(ii) මුදල් පොතකට අදාළ මූලාශ්‍ර ලේඛන 2ක් ලියන්න. (ලකුණු 02)

(iii) පහත දැක්වෙන්නේ ලක්ෂාන්ගේ ව්‍යාපාරයේ ජනවාරි මස මුල් සතිය තුළ සිදු වූ ගනුදෙනු කීපයකි.

(1) 2018.01.01 මුදල් ශේෂය රු. 175 000

(2) ලදුපත් අංක 01 - 2018.01.05 ලක්ෂාන් අමතර ප්‍රාග්ධනය ලෙස රු. 50 000ක් යෙදවීම.

(3) ලදුපත් අංක 02 - 2018.01.06 රු. 50 000ක බැංකු ණයක් ලබා ගැනීම.

(4) වවුචර් අංක 20 - 2018.01.06 රු. 75 000ක බඩු තොගයක් මිලට ගැනීම.

(5) වවුචර් අංක 09 - 2018.01.07 අයිතිකරු වූ ලක්ෂාන් සිය පෞද්ගලික ප්‍රායෝජනයට රු. 25 000ක් රැගෙන යාම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු මුදල් පොතක සටහන් කිරීම. (ලකුණු 04)

(ආ) එම ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම හා ගිණුම් තුලනය කිරීම. (ලකුණු 04)

(ලකුණු 12)

(07) (i) බැංකු අයිරාව යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

(ii) බැංකු ප්‍රකාශනය යනු කුමක්ද? (ලකුණු 02)

(iii) පහත දැක්වෙන්නේ සංජනගේ ව්‍යාපාරයේ මාර්තු මස මුල් සතිය තුළ සිදු වූ ගනුදෙනුවේ.

2018.3.01 බැංකු ශේෂය රු. 110 000

2018.3.2 ව්‍යාපාරයේ විදුලි බිල චෙක්පතකින් ගෙව්වා රු. 5 000

2018.3.3 පෙබරවාරි මස ලද රු. 50 000ක් වටිනා චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම.

2018.3.4 රු. 30 000ක චෙක්පතක් නිකුත් කර භාණ්ඩ මිලදී ගැනීම.

2018.3.5 ව්‍යාපාරයේ ගොඩනැගිලි කුලිය රු. 15 000ක් චෙක්පතකින් ගෙවීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු බැංකු ගිණුමේ සටහන් කර තුලනය කිරීම. (ලකුණු 04)

(අ) එම ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම හා ගිණුම් තුලනය කිරීම. (ලකුණු 04)

(ලකුණු 12)